ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, අයවැයගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා පිළිබඳ සංසන්දනාත්මක ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝඅභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යයම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අදාළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.) 01 හි 150 (ආ) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ ප්‍රසිද්ධ කරන ලද තොරතුරුවල වෙනත් ස්ථානයක හෙළිදරව් කර නැත්නම් මණ්ඩලය විසින් මණ්ඩලයේ මෙහෙයුම්වල ස්වභාවය හා එහි ප්‍රධාන කටයුතුවල විස්තරයක් හෙළිදරව් කළ යුතු වුවත්, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ එහි ප්‍රධාන කාර්යයන් හා ස්වභාවය පිළිබඳ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.	2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දක්වා සෑම වර්ෂයකම ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳව සහ කාර්ය සාධන ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලද අතර 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී රජයේ විගණන අංශය විසින් ලද උපදෙස් අනුව එම වාර්තාව ඉවත් කරන ලදී. 2025 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ආ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලට අදාළ ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 02 හි 08 ඡේදය ප්‍රකාරව මූල්‍යයන ක්‍රියාකාරකම් යනු ස්කන්ධ ප්‍රග්ධනයේ හා ණය ගැනීම්වල ප්‍රමාණයේ හා සංයුතියේ වෙනස්වීම් ප්‍රතිඵලයන් වන ක්‍රියාකාරකම් වන අතර, එසේ මූල්‍යයන ක්‍රියාකාරකම් නොවන සේවක මණ්ඩල ණය අයකර ගැනීම් රු. 4,135,210 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දැක්වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය වැඩියෙන් හා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ)	වාර්තාකරණ දිනෙන් පසු සිදුවීම්වලට අදාළ ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 06 හි 24 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීමට අනුමත කල දිනය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට තරම් ප්‍රමාණාත්මක සිදුවීම් වාර්තාකරණ දිනෙන් පසු වාර්තා වී නොමැත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඈ)	දේපළ, පිරියත හා උපකරණවලට අදාළ ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 07 හි 14 ජේදය ප්‍රකාරව පුද්ගල මාත්‍රාමිතික සේවා (Personal Monetarily Service /TLD Service) සැපයීමේදී කුලියට දීම සඳහා භාවිතා කරනු ලබන මාස 50 ක පමණ ඵලදායි ජීව කාලයක් සහිත රු. මිලියන 24.1 ක් වටිනා තාප සංදීප්ත කාඩ්පත් සහ රදවනයන් (TLD Cards & Heders) හා ගැමා මධ්‍යස්ථානය පිහිටි ඉඩම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. එසේම 65 ජේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු කරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවත්, මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් නමුත් තවදුරටත් භාවිතා කරනු ලබන රු. 60,296,240 ක් පිරිවැය වූ විද්‍යාත්මක උපකරණ, කාර්යාල උපකරණ, වෙනත් උපකරණ, කාර්යාල සවිකිරීම්, ගෘහ උපකරණ, විදුලි උපකරණ හා පරිගණක යන වත්කම්වල ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.3- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි ප්‍රමිතියෙහි ප්‍රතිපාදන අනුව ප්‍රතිශෝධනය කර නොතිබුණි.	TLD Cards හා Holders තක්සේරු ගත කරලීම පිළිබඳ 2025 ගිණුම් වර්ෂය තුල දී කටයුතු කරනු ඇත. ඉඩම් හා ගොඩනැගිලි අයිතිය පිළිබඳ ආයතනික විගණන කමිටුව විසින් අවධානය යොමු කරමින් පවතින අතර එහිදී ගත යුතු ඉදිරි පියවරයන් ගැන සලකා බලනු ඇත. මුළුමනින්ම ක්ෂය වූ පරිගණක හා උපාංග ප්‍රත්‍යාගනන කරලීමේ වාර්තාව මේ වන විට ආයතනයේ විගණන කමිටුවෙහි සමාලෝචනය කරන අතර ඉතිරි සියලු වත්කම් ප්‍රත්‍යාගනනය කරලීම් සඳහා විගණන කමිටුවේ උපදෙස් මත2025/04/28 දින අභ්‍යන්තර කමිටු පත්කර ඔවුනට 2025/08/31 දිනට පෙර කටයුතු සම්පූර්ණ කරන ලෙස දන්වා ඇත. (බලන්න ඇමුණුම් අංක 04)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඉ)	ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 07හි 79 ජේදය ප්‍රකාරව පිරිවැය රු.19,355,515 ක් වටිනා අක්‍රීය උපකරණ අයිතම 18 ක් සඳහා හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොතිබුණු අතර ශ්‍රී ලංකාවෙන්	අක්‍රීය උපකරණ සඳහා හානිකරණ අලාභ ප්‍රතිපාදන වෙන් කරලීම් සිදු කර නොමැත. කෙසේ වෙතත් 2025 වර්ෂයේ පටන් මේ සම්බන්ධව පූර්ණ අනුකූල වනු ඇත. Cobalt 60 වත්කම සම්බන්ධයෙන්	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය.

	අපනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය හා අත්වැසුම් ජීවානුහරණය කර අපනයනකරුවන් වෙත සේවා සැපයීම සඳහා ස්ථාපිත කර ඇති ගැමා මධ්‍යස්ථානය සඳහා භාවිතා කරනු ලබන පිරිවැය රු.448,920,949 ක් වටිනා කොබෝල්ට් 60 මූලද්‍රව්‍යයට අදාළ ක්ෂය වටිනාකම එහි භාවිතය අනුව මාසිකව හඳුනාගෙන ගිණුම්ගත කරනු ලබයි. නමුත් ප්‍රමිතියේ 86(ආ) ඡේදය ප්‍රකාරව එම වත්කම ක්ෂය කරනු ලබන ක්‍රමවේදය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. ප්‍රවර්ථන වර්ෂයට අදාළව හඳුනාගත් ක්ෂය ප්‍රමාණය රු.10,875,018 ක් විය. එය පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 2.42 ක් විය.	ප්‍රයෝජනවත් ජීවිත කාලය මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොමැති අතර 2025 වර්ෂයේ පටන් මේ සම්බන්ධව පූර්ණ අනුකූල වනු ඇත.	
(ඊ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 -සේවක ප්‍රතිලාභ ප්‍රමිතියේ 61 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය එනම් අස්ථිත්වයේ වර්තමාන සේවා පිරිවැය, සේවක පිරිවැටුප්, දුබලතාවය සහ කලින් විශ්‍රාම යාමේ අනුපාතිකය, වෛද්‍ය සැලසුම් යටතේ ඉල්ලීම් අනුපාතිකය, මරණ සංඛ්‍යාව, සේවකයින්ගේ ආයු අපේක්ෂණය, විශ්‍රාම වයස, වට්ටම් අනුපාතය වැනි උපකල්පන යොදාගෙන පශ්චාත් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය හා වෙන්කිරීම ගණනය කර නොතිබුණි.	ගිණුම්කරණ ප්‍රමිති අංක 19 අනුව ගනණය කරලීම් සඳහා ආයු ගණනය ක්‍රමය යොදා ගෙන නොතිබුණි. මෙහිදී 2025 අප්‍රේල් මස ඔබ විසින් ලබා දුන් ආයු ගණන ක්‍රමය ගණන කරලීම සඳහා උපයෝගී වන ආකෘතිය, 2025 වර්ෂයේ සිට අනුගමනය කරනු ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය.

1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ගිණුම්කරන ප්‍රතිපත්ති 1.3 අනුව මෝටර් වාහන හැර අනෙකුත් දේපල පිරියත හා උපකරණ ගිණුම් තැබීම සඳහා පිරිවැය ආකෘතිය භාවිතා කරනු ලබන බව හෙළිදරව් කර තිබුණි. එසේම ප්‍රතිපත්ති	ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ මොටර් වාහන හැර අනෙකුත් හා උපකරණ පිරිවැය ආකෘතිය භාවිතා කර ගිණුම් තැබීමත් මොටර් වාහන ප්‍රත්‍යාගණන අගයට වාර්තා කිරීමත්ය. මේ අනුව මූල්‍ය ප්‍රකාශණයන්හි ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 1.3.1 නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	දේපල පිරියත හා උපකරණ ගිණුම් තැබීම සඳහා භාවිතා කරන ආකෘතිය පැහැදිලිව හෙලිදරව් කළ

1.3.1 අනුව යටිතල පහසුකම්, දේපල පිරියත හා උපකරණ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගයට වාර්තා කරනු ලබන බව සඳහන් කර තිබුණි. ඒ අනුව අධිකාරිය එම වත්කම් වාර්තා කරනු ලබන ආකෘතිය කුමක්ද යන්න විගණනයේදී ගැටළු සහගත විය.		යුතුය.

1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය		කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නාගරික සංවර්ධන අධිකාරිය මාලබේ ප්‍රදේශයේ අක්කර 3 පර්චස් 36.5 ක් ලබාදී තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු. මිලියන 181 ක මුදල නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. නමුත් එල්ල වූ මහජන විරෝධතා හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතරමග නවතා එකී ඉඩම ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට ලබාදී, එම ආයතනයට අයත් ඔරුගොඩවත්තේ පර්චස් 243 ක ඉඩම මණ්ඩලයට අවබෝධතා ගිවිසුමක් මඟින් ලබා දී තිබුණි. එහිදී නාගරික සංවර්ධන අධිකාරියට මණ්ඩලය ගෙවූ රු.මිලියන 181 ක මුදල ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට ලබාදුන් ඉඩමේ තක්සේරු වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් ඉහත සඳහන් රු.මිලියන 181 ක මුදල තවදුටත් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ අතර ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මණ්ඩලයට පවරාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	1996 වසරේදී නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන තිබූ ඔරුගොඩවත්ත ප්‍රදේශයේ ඉඩමට අදාල බදු ගිවිසුම අවසන් කිරීම හේතුවෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් මණ්ඩලයට ලැබිය යුතු මුදල නැවත අය කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව දක්වා තිබුණද, එම මුදල් අය කර ගැනීමට අදාල ආයතන වෙත ලිඛිතව දැනුම්දීම් මෙන්ම අදාල ආයතන සමඟ රැස්වීම්වලට සහභාගී වෙමින් ඒ පිළිබඳව අවස්ථා කිපයකදීම සාකච්ඡා පවත්වා ඇත. නමුත් එම ගැටළුවට පැහැදිලි විසඳුමක් ලැබී නොමැත. එමෙන්ම නව ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් හා මාලබේ ඉඩම ලබා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා ඇති රු. මි. 181 අයකර ගැනීම ආදී කටයුතු සම්බන්ධයෙන් නීතිමය උපදෙස් ලබා ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නීතිපති දෙපාර් තමේන්තුව වෙත යොමු කරනු ලදුව, රාජ්‍ය ආයතන අතර පවතින අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමක් කර ඇති විට 2018.05.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඉදිරි පියවර ගැනීම යෝග්‍ය බව සඳහන් කරමින් නීතිපති දෙපාර්තමේන්තුවේ මතය ලබාදී ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරුන් සමග සාකච්ඡා කර විසඳා ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා ඇත. ඒ අනුව කටයුතු කෙරෙමින් පවතී.	ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය.

(ආ)	2025 වර්ෂයේ 151 වවුචරය මගින් 2024 වර්ෂයේ සේවා හා නඩත්තුව වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත රු.182,468 ක මුදලක් ගෙවා තිබුණු අතර එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	සියළුම ගෙවිය යුතු වියදම් ගිණුම්ගත කල යුතුය.
(ඇ)	2024 වර්ෂයට අදාළ වියදම් වර්ග 5 ක් සඳහා රු. 2,069,972 ක් අඩුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්වල ප්‍රතිපාදනය කර තිබුණි.	2025 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ගණුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.5.5 නොසැසඳූ පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පරමාණු බලශක්ති අධිකාරිය අභෝසිකර මණ්ඩලය ස්ථාපිත කිරීමේදී ස්ථාවර වත්කම් ලේඛන අනුව රු. 344,470,250 ක ස්ථාවර වත්කම් මාරුකර තිබුණද, භෞතික පරික්ෂාවට අනුව මාරුකල ස්ථාවර වත්කම් ප්‍රමාණය රු. 323,368,373 ක් පමණක් විය. ඒ අනුව රු. 21,101,877 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස නිරවුල් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	පරමාණු බලශක්ති අධිකාරිය අභෝසිකර මණ්ඩලය ස්ථාපිත කරලීමේදී වූ රු. 344 Mn හා භෞතිකව තිබූ රු. 323 Mn අතර වූ 21Mn වෙනස නිරවුල් කර ගැනීම සඳහා වන විකල්ප ක්‍රියා මාර්ගයකට අනුකූල වන ලෙස තොරතුරු ලබාදීමට 31.03.2025 පැවති ආයතනික විගණන කමිටුව මාස 02 ක කාලයක් නි.අ. (මූල්‍ය) වෙත පවරා ඇත. එම ගණනය කරලීම් හා තොරතුරු නියමිත කාල කඩඉම තුල සම්පූර්ණ කර ඉදිරි කටයුතු සඳහා යොමු කරනු ඇත.	වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.5.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් තුළ රු. 31,850 ක භාවිතා නොවන අයිතම හා රු. 397,758 ක භාවිතා නොවන රසායනාගාර රසායනික ද්‍රව්‍ය වර්ෂ 5 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශන තුල හඳුනාගෙන ඇති අතර, මින් රු. 397,758 ක භාවිතා නොවන විද්‍යාගාර රසායනික ද්‍රව්‍ය වෙනුවෙන් එම සම්පූර්ණ වටිනාකම වෙනුවෙන් හානිකරණ අලාභ සඳහා වෙන් කර තිබුණි. නමුත් මෙම ශේෂ හඳුනාගැනීම සඳහා තොග උපලේඛන, තොග සමීක්ෂණ වාර්තා යනාදී ලේඛණ විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.	රු. 397,758/- ක භාවිතා නොවන විද්‍යාගාර රසායනික ද්‍රව්‍ය සඳහා උපලේඛනය ඇමුණුම 08 මගින් ඉදිරිපත් කර ඇති අතර මෙම අයිතම සම්බන්ධව අවශ්‍ය කටයුතු මෙම වර්ෂයේදී සිදු කරනු ලැබේ. (බලන්න ඇමුණුම් අංක 08)	තොග උපලේඛන තොග සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය.

(ආ)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 449,344,289 ක් වූ නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ කොබෝල්ට් 60 මූල ද්‍රව්‍යය, විකිරණ පහසුකම් යනාදී ස්ථාවර වත්කම් පන්ති 02 කට අදාළ විස්තර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එම වත්කම් වල පිරිවැය, වාර්ෂික ක්ෂය සහ මිලදී ගැනීම් ආදී තොරතුරු විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.	අදාල ස්ථාවර වත්කම් ලේඛණ ඇමුණුම 09 මගින් ඉදිරිපත් කරමි. (බලන්න ඇමුණුම් අංක 09)	වත්කම් පිලිබඳ සියළු තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට රු. 175,769,436 ක් වටිනා පිරියත හා උපකරණ ශේෂයෙහි එකිනෙක අයිතමයෙහි වත්කම් මිලදී ගැනීම් පිළිබඳ විස්තර ඇතුලත් ක්ෂය ගණනය කිරීමට අදාල උපලේඛණය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් එම වත්කම්වල වටිනාකම, වර්ෂය සඳහා ක්ෂය වියදම රු.11,744,884 ක් හා ක්ෂය වෙන් කිරීම රු.110,466,269 ක නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.	2024 වර්ෂයේ ක්ෂය ප්‍රමාණය ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඒ ඒ වත්කම් සඳහා වන උප ලේඛනයන් හි නිරූපණය වේ.	දත්ත සහ තොරතුරු සම්පූර්ණයෙන් ඇතුලත් ස්ථාවර වත්කම් රෙජිස්ටරය විගණනය සඳහා ඉදිරිපත් කල යුතුය.

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු ගිණුම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට රු. 63,597,613 ක වෙළඳ ණය ගැති ශේෂයක් පැවති අතර එම ශේෂය තුළ වර්ෂ 1 ට වැඩි හා වර්ෂ 3 ට අඩු රු.12,304,412 ක ණයගැති ශේෂයක්ද, වර්ෂ 3 ට වැඩි හා වර්ෂ 5ට අඩු රු. 1,815,133 ක ණයගැති ශේෂයක්ද, වර්ෂ 5 ට වැඩි රු. 1,188,220 ක ණයගැති ශේෂයක්ද පැවතුණි. මෙම දිගුකාලීන හිඟහිටි ශේෂ අයකර ගැනීමට මණ්ඩලය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.	2025.04.30 දින වන විට 2024.12.31 දිනට වූ ණයගැති ශේෂය වන රු. 63.597 Mn අගයෙන් 42% ප්‍රමාණය වන රු.26.71 Mn අයකරගෙන තිබුනි. 2025.04.30 දින වන විට පැවති රු.36.8 Mnඅගය ද විස්තරාත්මකව මේ සමඟ අමුණා ඇත. (බලන්න ඇමුණුම් අංක 07)	හිඟ හිටි ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය.
(ආ)	මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට පවතින රු. 4,895,942 ක වෙනත් ණයගැති ශේෂය තුල වර්ෂ 01 සිට වර්ෂ 05 කට වැඩි කාලයක් දක්වා අයනොවී පවතින එකතුව රු. 277,172 ක් වූ ණයගැති ශේෂ 08 ක් පැවතුණ අතර, මෙම ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. තවද දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කාර්යමණ්ඩල ණයගැතියන් රු. 362,209 ක් පැවතියද, ඉන් රු. 92,750 ක් වූ RAS 07/30 දරන කාර්ය මණ්ඩල ණයගැති ශේෂය වර්ෂ 5 ක් පැරණි වන අතර, මෙම	2025 වර්ෂයේදී මෙම අගයන් නිවැරදි කරලීම සඳහා කටයුතු යොදනු ඇත.	හිඟ හිටි ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය.

	ණයගැතියන්ගෙන් ණය අයනොවීමේ අවධානම් සහිත ණයගැති ශේෂ හඳුනාගෙන ඒ සඳහා හානිකරණ අලාභ ලෙස වෙන් කිරීම් සිදුකර නොතිබුණි.		
(ඈ)	කාර්තුවකට වරක් ස්ව තක්සේරු පදනමින් ආදායම් බදු ගෙවීමේදී මණ්ඩලය විසින් බදු වගකීම ඉක්මවා බදු ගෙවීම හේතුවෙන් රු. 1,031,961 ක බදු වත්කමක් 2018 සිට ඇති වී තිබූ අතර, අදාල ව්‍යවස්ථාපිත කාලය තුළ එම වැඩිපුර ගෙවීම් හිලව් කරගෙන නොතිබුණි. වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් විමසා ශේෂයන් නිරවුල් කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.	දේශිය අදායම් දෙපාර්තුමේන්තුවෙන් විමසා මෙම ශේෂය නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් විමසා ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට රු. 207,317,483 ක් වූ වෙනත් ජංගම වත්කම් ශේෂය තුළ වර්ෂ 6 ක් පැරණි රු.3,248,395 ක ලැබිය යුතු වැට් බදු ශේෂයක්ද, රු.863,562 ක ලැබිය යුතු ආර්ථික සංවර්ධන ගාස්තු ශේෂයක් හා රු.587,285 ක ලැබිය යුතු රඳවාගැනීමේ බදු ශේෂයක්ද පවතින අතර එම ලැබිය යුතු බදු ශේෂ බදු ගෙවීමේ දී හිලව් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	රු. 207, 317, 483/- ක් වූ වෙනත් ජංගම වත්කම් ශේෂය තුල ඇති වර්ෂ 6ක් පැරණි රු.4,699,242/- ක් වූ ණයගැති ශේෂය අතරින් රු. 3,248,395/- ක් වූ ණයගැති ශේෂය නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ ආයතනයට ගෙවිය යුතු අවසන් බිල්පතෙහි සඳහන් වැට් මුදල වේ. මෙම බිල්පත ගෙවීම පිලිබඳ අවසන් තීරණයකට එළඹෙන තෙක් මෙම ශේෂය නිරවුල් කිරීමට නොහැක. අනෙකුත් ණයගැති ශේෂ නිරවුල් කිරීමට හැකි ඉක්මනින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	හිඟ හිටි ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය.

1.7 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 570 සහ 571 රෙගුලාසි	ව්‍යාපෘති සම්පූර්ණ කල දින සිට වර්ෂ 2 ක් ඉක්ම වූ රු. මිලියන 4 ක රඳවාගත් මුදල් ශේෂ 3 ක් ආපසු පියවීමේ වගකීම පිළිබඳ තක්සේරු කර මණ්ඩලයේ ආදායමට බැරකිරීම හෝ පියවීම සිදුකර නොතිබුණි.	SLRDC වෙත ගෙවිය යුතු රදවා ගත් මුදල් තවදුරටත් රදවා ගත යුතු අතර අනෙකුත් රදවා ගත් මුදල් පියවීමට මෙම වර්ෂයේදී කටයුතු කරනු ලැබේ.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය			
(i) 1 ඡේදය	මණ්ඩලය විසින් උපායමාර්ගික සැලැස්මට අනුකූලව පුරෝකථනය කළ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සකස් කර නොතිබුණි.	යාවත්කාලීන උපාය මාර්ග සැලසුම පිළියෙල කළ වහාම ඊට අනුරූපී පුරෝකථනය කළ මූල්‍ය ප්‍රකාශයන් සාදනු ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii) 3.2 වගන්තිය	මුදල් වර්ෂය අවසාන වී මාස 05 ක් ගතවීමට පෙර හා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික කාර්යය සාධන සමාලෝචන රැස්වීමක් (APRM) පැවැත්විය යුතු වුවත් මණ්ඩලය විසින් 2022, 2023 මූල්‍ය වර්ෂ සඳහා එම රැස්වීම් මේ දක්වා පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේදී යොදා ගෙන තිබුණු APRM රැස්වීම 2024.10.07 දිනැති ජනාධිපති ලේකම්ගේ අංක PS/PSG/P-SEC/2024-01 දරණ ලිපියෙහි වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අත්හිටුවීමට වූ උපදෙස් මත තැබීමට නොහැකි වූ අතර එය විගස තැබීමට ආයතනය කටයුතු කරනු ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 45.5 ක ඌෂණතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 74.5 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 120 ක පසුබෑමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයට සාපේක්ෂව පරිත්‍යාග රු.මිලියන 13.2 කින්ද ගැමා මධ්‍යස්ථානයේ අයනීකාරක සේවා ආදායම රු.මිලියන 25.5 කින්ද,වෙල්ඩින් සුදුසුකම් ලබාදීමේ පහසුකම් ආදායම රු.මිලියන 24.4 කින් අඩුවීම හා ජීවන වියදම් දීමනාව රු.මිලියන 8.3 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල විචලතා විශ්ලේෂණය

ආදායම් /වියදම් අයිතමය	2024 රු. මිලියන	2023 රු. මිලියන	විචලනය රු.මිලියන	විචලන ප්‍රතිශතය %
අයනීකාරක සේවා ආදායම -ගැමා මධ්‍යස්ථානය	45.4	70.9	(25.5)	36
ආහාර පරීක්ෂා කිරීමේ ආදායම	57.4	64.1	(6.7)	10.4
NDT පුහුණු පාඨමාලා	2.1	5.6	(3.5)	62.5
IRMS පුහුණු පාඨමාලා	0.5	6.2	(5.7)	92
වැල්ඩින් සුදුසුකම් ලබාදීමේ පාඨමාලා ආදායම	4.1	28.5	(24.4)	86
NCNDT හි වැටුප් වියදම	18.5	28.3	9.8	34.6
ජීවන වියදම් දීමනාව	16.3	7.9	8.4	106.3
මෝටර් වාහන අළුත්වැඩියාව	5.0	1.9	3.1	163

2.3 අනුපාත විශ්ලේෂණය

අනුපාතය	2024	2023	2022	2021	2020
හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය	(1.75)	2.79	0.77	4.92	8.66
මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය	(1.65)	2.62	(0.72)	4.64	4.78
ජංගම වත්කම් අනුපාතය	3.17	2.65	2.34	2.67	4.49
ශුද්ධ අතිරික්ත අනුපාතය	(22.09)	28.83	(10.19)	73.29	2.74

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කලමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් (ERP) නිර්මාණය, සංවර්ධනය, ස්ථාපනය, ක්‍රියාත්මක කිරීම, සත්කාරය සහ නඩත්තුව සඳහා වන ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන	තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම ප්‍රසම්පාදන මාර් ගෝපදේශ අනුව සිදුකර නොමැති බව සඳහන් කරමි. නමුත් එම පත් කිරීම සිදු කර ඇත්තේ මෘදුකාංග සම්බන්ධයෙන් විෂය	අදාල කාර්ය අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

	මාර්ගෝපදේශ 4. 1. 1. (ඈ) ප්‍රකාරව ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කිරීමකින් තොරව 2021 වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර තිබුණි. තවද තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා මාර්ගෝපදේශ 2.8.4 (ඇ) ප්‍රකාරව බාහිර ප්‍රසම්පාදන විෂය සම්බන්ධ දැනුම සහිත සාමාජිකයෙකු පත්කර නොතිබුණි. 2022 මාර්තු මස රු. මිලියන 6.87 ට අදාල කාර්යය සඳහා ගිවිසුම්ගත වී තිබුණු අතර 2023 මැයි වන විට කොන්ත්‍රාත් මුදලින් රු මිලියන 2.43 ක් (සියයට 35) ක් ගෙවා තිබුණි. ගිවිසුම් කාලය 2023 දෙසැම්බර් 16 න් අවසන් වී තිබුණද අදාල කාර්යය අවසන් කර නොතිබුණි.	දැනුමක් ඇති බව හඳුනාගෙන ඇති සාමාජිකයින් හා මූල්‍ය හා ප්‍රසම්පාදන සම්බන්ධව විෂය දැනුම ආවරණය වන පරිදි වේ. විෂය දැනුමක් සහිත බාහිර ආයතනයක නිලධාරියෙකු පත් කර ගැනීමට කටයුතු කර නොමැත. ඉදිරියේදී ඇගයීම කමිටු පත් කිරීමේදී ප්‍රසම්පාදන මාර් ගෝපදේශ අනුව සිදු කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි.	
(ආ)	පැස්සුම් ශිල්පී සුදුසුකම්කරණ සහතිකපත් පාඨමාලාව මඟින් 2023 වර්ෂයේදී මණ්ඩලය රු.මිලියන 28 ක අදායමක් උපයාගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී එය රු.මිලියන 4.1 ක් වීම හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 23.9 කින් ආදායම අඩු වී තිබුණි.එය ප්‍රතිශතයක් ලෙස සියයට 85 අඩුවීමකි. අභ්‍යන්තර පැස්සුම් අංශය මඟින් අදාළ පාඨමාලාව 2022 වර්ෂය දක්වා පවත්වාගෙන ගොස් තිබූ අතර 2023 ජූලි මාසයේ දී මෙම පාඨමාලාව සිදු කිරීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි.	ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව රජයේ ආශිර්වාදය ඇතුව සුදුසුකම් ලත් වෙල්ඩින් කාර්මික ශිල්පීන් සඳහා අප විසින් නිකුත් කරන WPQ සහතිකය අප වෙත ඉහළ ඉල්ලුමක් ලැබීමට ප්‍රධානතම හේතුවකි. SLAEB වෙත ලැබුණු එම කීර්තිය ජාතික හා ජාත්‍යන්තර වෙල්ඩින් ප්‍රජාව අතර තවමත් පවතී. තවද 2023 වර්ෂයේදී WPQ සඳහා පැවතුණු අසාමාන්‍ය ඉල්ලුමට හේතුකාරක වූයේ එම කාලය තුළ වෙල්ඩින් කාර්මිකයන් සඳහා කොරියානු නැව් සමාගම් සඳහා පැවැති දැඩි ඉල්ලුම වේ.එහෙත් 2024 වර්ෂයේදී අප හට පාලනය කර ගත නොහැකි සාධක මත ඒ සඳහා වූ ඉල්ලුම දැඩි ලෙස අඩු වුණි.	ආදායම ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	නිර්විනාශක ජාතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි මුලු පිරිවැය ඇස්තමේන්තුව රු. 308,653,543 ක් වන අතර 2014 වර්ෂයේදී නිමකරන ලද ගොඩනැගිල්ල සඳහා වැය වූ මුළු පිරිවැය රු. 428,981,984 ක් විය. ඒ අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා රු.120,328,441 ක් වැයකර තිබුණද ඒ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි.	මෙම මිල විචලනය අනුමත කර ගැනීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ගැනීමට පත්‍රිකාවක් මේ වන විට රේඛීය අමාත්‍යාංශය මඟින් සැදීමට තීරණය කර ඇත.	විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	2015 වර්ෂයේදී නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබුණු රු.මිලියන 8.2 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට අක්‍රීය වී තිබුණි. ප්‍රධාන කාර්යාලයට යොමු කල මෙම අලුත්වැඩියාවට අදාල ප්‍රසම්පාදන ලිපිගොනුව මාස 8 ක් අස්ථාන ගත වීම හේතුවෙන් විගණිත දිනය වූ 2025 අගෝස්තු 31 වන විට ද එය අළුත්වැඩියා කර නොතිබුණ බව නිරීක්ෂණය විය.	මෙම යන්ත්‍රය අලුත්වැඩියා කරලීම සඳහා 2025 වර්ෂයේදී පියවර ගනු ලබන අතර ලිපි ගොනු බාර දීම හා බාර ගැනීම මේ වන විට නිසි ක්‍රම වේදයකින් සිදුකරලීමට කටයුතු කර ඇත.	විදුලි ජනක යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට කටයුතු සිදුකල යුතුයි.

3.2 **නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොන්ක්‍රිට් පරික්ෂාව සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 1.66 කට මිලට ගෙන තිබූ කොන්ක්‍රීට් සාම්පල ලබා ගැනීමේ උපකරණය මිලටගත් දින සිට මේ දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.	අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවල උපදෙස් පරිදි මෙය ප්‍රයෝජනවත් වන වෙනත් රාජ්‍ය ආයතනයකට පැවරීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. මෙය ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මිල ගෙවීමකින් තොරව පවරා ගැනීමට එකඟ වුවත්, ඉදිරියේදී අපහට සේවාවක් අවශ්‍ය වුවහොත් එය නොමිලයේ කර දීමට එකඟ නොවීම මත, නිසි තීරණයක් ගැනීම උදෙසා 2025 ජුනි මස අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරලීමට නියමිතය.	මෙම උපකරණය අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2019 වර්ෂයේදී රු.මිලියන 22.9 ක් වැයකර ලංකා තේ වියාපෘතියේ සාම්පල් හා වෙනත් සාම්පල් පරීක්ෂණ කටයුතු සඳහා මිලදී ගන්නා ලද උපකරණය සමඟ මිලදී ගත යුතු ජංගම දුරකථන මෘදුකාංග සහ ගෑස් සිලින්ඩරය සපයාගෙන නොතිබීම නිසා මේ දක්වා කිසිදු සාම්පලයක් පරික්ෂා කර නොතිබුණි.	මෙම ප්‍රසම්පාදනය මෙතෙක් ඉටුකර ගැනීමට නොහැකි වූ හේතුන් හා මේ වන විට 2025 ප්‍රාග්ධන අයවැයට ඇතුලත් කරන ලද මෙම අයිතමය, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ තාක්ෂණ ඇගයීම් වාර්තාව දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව. උපදෙස් මත රජයේ හා කළමනාකරණ කමිටුවේ උපදෙස් මත රජයේ විගණකයින්ට 2025.05.19 දින යොමු කර ඇත.සවිස්තරාත්මක වාර්තාව 2025.05.19 දින SLAEB/2025/02 යන අංකයෙන් මේ වන විට රජයේ විගණකයින් වෙත යොමු කර ඇත.	අවශ්‍ය උපාංග මිලදීගෙන සාම්පල් පරික්ෂා කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	2019 වර්ෂයේ ජෛව විද්‍යාත්මක විද්‍යාගාරයේ ස්ථාපිත කර තිබුණු රු. මිලියන 23 ක් වටිනා උපකරණය සඳහා වන සේවා ගිවිසුම්වලට එළඹ නොතිබුණු අතර උපකරණය මිලදීගැනීමට පෙර උපකරණය සම්බන්ධයෙන් පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදුකර නොතිබුණි.මෙම උපකරණය 2021 වර්ෂයේ අක්‍රිය වී අළුත්වැඩියා කිරීමෙන් පසුව 2022 වර්ෂයේ නැවත අක්‍රිය වී තිබුණු අතර මේ වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි.	මෙයට අදාල පිලිතුර මෙහි සඳහන් 2.2.4 (අ) (iii) හි පිලිතුර හා සම්බන්ධ වේ. මෙම ප්‍රසම්පාදනය මෙතෙක් ඉටුකර ගැනීමට නොහැකි වූ හේතුන් හා මේ වන විට 2025 ප්‍රාග්ධන අයවැයට ඇතුලත් කරන ලද මෙම අයිතමය, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ තාක්ෂණ ඇගයීම් වාර්තාව දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව. උපදෙස් මත රජයේ හා කළමනාකරණ කමිටුවේ උපදෙස් මත රජයේ විගණකයින්ට 2025.05.19 දින යොමු කර ඇත.සවිස්තරාත්මක වාර්තාව 2025.05.19 දින SLAEB/2025/02 යන අංකයෙන් මේ වන විට රජයේ විගණකයින් වෙත යොමු කර ඇත.	උපකරණය අළුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ යටතේ වසර 05 කට පෙර ආරම්භ කරන ලද රු3,414,568. ක් වන නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය විධිමත් අධ්‍යයනයකින් තොරව සහ අකාර්යක්ෂමතාවයකින් යුතුව සිදු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් කර නොමැති අතර,ඒ සඳහා දරන ලද වියදම් නිෂ්කාර්ය වියදම් බවට පත් වී තිබිණි.	කෙරීගෙන යන වැඩ අතරින් මේ වන විට ඉවත්ව ඇති කටයුතු • කෙරීගෙන යන වැඩ අතරින් Procedure Manual for AEB, Development of Project Web සහ Cyclotron Project යන ව්‍යාපෘති මේ වන විට අවසන් කර ඇති අතර 2025 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. තවදුරටත් කෙරීගෙන යන වැඩ අතරින් පහත ලෙස තොරතුරු අදාළ වේ. New Bulidings -NAITA මෙහි සඳහන් -) 1.2.4අ.හි පිළිතුර මත බැඳී පවතී (	ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.	රජයේ විගණකයින් හා එකඟ වේ. ඉදිරි නිවැරදි කරලීම් පියවර ගනු ලැබේ.	ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය.

(ආ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදනය ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදනයන්හි පියවර ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කල යුතු වුවත් මණ්ඩලය විසින් රු. මිලියන 72.29 ක් වටිනා ප්‍රධාන ප්‍රසම්පාදන 43 ක් සඳහා ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කර නොතිබුණි. මේ හේතුවෙන් 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් රු.මිලියන 49.5 ක් වටිනා ප්‍රසම්පාදන 18 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය විසින් සිදුකිරීම ආරම්භ කර හෝ නොතිබුණු අතර 2024 වර්ෂය තුළදී නිම කිරීමට සැලසුම් කර ඇති රු. මිලියන 6.75 ක් වූ ප්‍රසම්පාදන කටයුතු 03 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් සැලකිය යුතු ප්‍රගති ප්‍රතිශතයක් නිරීක්ෂණය නොවුණි.	රජයේ විගණකයින් හා එකඟ වේ. ඉදිරි නිවැරදි කරලීම් පියවර ගනු ලැබේ.	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලය විසින් රු) 1.378 මිලියන.බදු රහිතක් වැය කර මිලදීගෙන තිබුණු (විකිරණ මිනුම් උපකරණ 2017 ක් සහ 08 වර්ෂයේදී විදේශ ආධාර වශයෙන් ලැබී ක් 8,995 තිබුණු යුරෝ වටිනා තවත් 2019 විකිරණ මිනුම් උපකරණයක් ලංකා වර්ෂයේදී තාවකාලික පදනමින් ශ්‍රී ගුවන් හමුදාවේ CBRNE අංශය වෙත ලබා දී තිබුණද වන විටත් එම 02 මැයි 2025 උපකරණ මණ්ඩලය වෙත ලබාගෙන ,නොතිබුනු අතරඑහි පැවැත්ම තහවුරු කර ගෙන නොතිබුණි.	මේ වන විට 2025.05.08)දින (ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මෙම අයිතම දෙක සම්බන්ධයෙන් සාධනීය වූ ප්‍රතිචාරයක් අප වෙත ලබා දී ඇත) .බලන්න ඇමුණුම් අංක (12/11	අදාල උපකරණ මණ්ඩලය වෙත ලබාගැනීමට කටයුතු කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයේ අනුමත සමස්ථ කාර්ය මණ්ඩලය ක් වන අතර 185 සමාලෝචිත වර්ෂය අවසානයට ජොෂ්ඨතෘතීක හා ද්වීතීක , 57 මට්ටම්වල පුරප්පාඩුක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 08 ක් ලෙස මණ්ඩලයේ සමස්ථ පුරප්පාඩු 65 ක් පැවතුණ අතරමෙය අනුමත , 35 වෙන් සියයටසේවක සංඛ්‍යා ක වැනි ඉහළ ප්‍රමාණයක් වීම හේතුවෙන් කාර්යක්ෂම සහ ඵලදායි පාලනයක් ක්‍රියාත්මක කිරීම මගින් පනතේ අරමුණු අපේක්ෂිත ආකාරයට ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක වී තිබුණි.	ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය ද ඒ වන විට නම් කර නොමැති වීම මත තවදුරටත් බඳවා ගැනීමේ කටයුතු ප්‍රමාද වූ බවත් අධ්‍යක්ෂ මණ්ඩලය නැවත නම් වන විට බඳවා ගැනීමට කැඳවූ අයදුම්පත් මාස 6 ඉක්මවා තිබුණිඒ . අළුතෙන් සුදුසුකම් සපුරන ලද වන විට අයදුම්කරුවන් ද සිටින බැවින් නැවත අයදුම්පත් කැඳවීමට උපදෙස් ලබා දෙන ලදීඒ . අනුව2025.03.10 දින නැවතත් භාෂා ත්‍රිත්වයෙන්ම දැන්වීම් පළ කරන ලද අතර ඒ අනුව අයදුම්පත් කෙටි ලැයිස්තුගත කර ඉක්මණින්ම බඳවා ගැනීමට කටයුතු කරනු ඇතමුබ පරීක්ෂණ මේ වන විට සම් . . කටයුතු සිදු කරමින් ඇතපැවත්වීමට අවශ්‍ය	මණ්ඩලයේ ප්‍රධාන කාර්යය භාර්යන්ට බලපාන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය.

4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තාව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලය විසින් එසේ කර නොතිබුණි. එසේම මූල්‍ය වර්ෂය අවසාන වී මාස 5 ක් ඇතුලත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2022හා 2023වර්ෂවල වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දිනය වන තෙක් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2022වාර්තා අමාත්‍යාංශය විසින් පෙන්නාදුන් අඩුපාඩු සකසා මේ වන විට අමාත්‍යාංශයට යවනු ලැබ ඇත . 2023වාර්තා කඩිනමින් සම්පූර්ණ කරලීමට මේ වන විට කටයුතු කර ගෙන යමින් පවතී.	වාර්ෂික වාර්තා නියමිත කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය.

4.2 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රල්ඛය මඟින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇමුණුම iv ප්‍රකාරව 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර එහි නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලයේ 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ ලබා නොගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන විගණනයට ඉදිරිපත් කර තිබුණි.	නව රජය පත්වූ පසු නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වූයේ 2025.02.19වන දිනය 2025.02.28වන දින ගිණුම් ඉදිරිපත් කරලීමේ අවසන් කාල කඩඉම් දිනය සපුරාලීමේ දැඩි අවශ්‍යතාවය මත 2025.02.26විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවා 2024වර්ෂයෙන් අවසාන ගිණුම් අනුමත කර ගන්නා ලදී. පලමු විගණන කමිටු නිළ වශයෙන් පත්වූයේ 2025.02.28දිනට පසුවය .එනම් 2025.03.31දින පලමු විගණන කමිටු රැස්වීම පවත්වන ලදී . එතෙක් 2024වර්ෂයේ අවසන් ගිණුම ප්‍රමාද කරනවාදැයි යන ගැටළුව අප වෙත විය. 2024වර්ෂයේ අවසන් ගිණුම් ප්‍රමාද නොකල යුතු බව තීරණය වීම මත සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යොමු කරන ලදී.	මූල්‍ය ප්‍රකාශන විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

4.3 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ අයවැය නිසිලෙස පුරෝකථනය නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 16 ක අයවැය ගත වියදම රු. 30,360,000 ක් හා තත්‍ය වියදම රු. 24,265,000 ක් විය. ඒ අනුව ඉහත වැය විෂයයන් 16 හි අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 25 සිට 137 දක්වා විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි වියදම් පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය.	2024 අයවැය ලේඛනයෙහි ජේලි අයිතමයන් 53 %25 ලෙස - හා + ක් පමණක් 15 කින් අයිතමයන් ට වඩා විචලනය වී ඇත	අයවැය ලේඛනය පාලන උපකරණය ක් ලෙස යොදා ගෙන විචලනයන් අවම කරගත යුතුය.